උරුමය

**යූ. එල්. ආරියරත්න**

අධිලේඛන පර්යේෂණ සහකාර, ජාතික ලේඛනාගාරය



# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමේදී

# බුද්ධාගමට

මහාවංශයට අනුව විජය රජුගෙන් ඇරඹි මෙරට රාජ්‍ය වංශය වරින්වර අන්‍ය ජාතික ආක්‍රමණිකයන් කිහිප දෙනෙකු අතට පත් වුවද 1739 ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ අභාවය තෙක්ම පැවතියේ සිංහල රාජවංශය අතය. දේවානම්පියතිස්ස රජු ඇතුළු පිරිස බුදු දහම වැළඳ ගැනීමෙන් පසුව මෙරට රාජ්‍ය ආගම වශයෙන් වර්ධනය වූයේ ද බුදුදහමය. වරින්වර හින්දු ආගමේ බලපෑම පැවතියත් රජරට, රුහුණු රට, මලය රට යන පැරණි බෙදීම තුළ වූ සිංහල රාජ්‍යයේ ත්‍රිසිංහලාධීශ්වර නම් නාමය දැරූ සිංහල රජවරුන්ගේ අනුග්‍රහය නොමඳව ලැබූ ආගම වූයේ බෞද්ධාගමයි. බුද්ධදාස රජුගේ සහ සිරි සංඝබෝධි රජුගේ රාජ්‍ය පාලන කාලයන්හි දි ඔවුන් වෙතින් දිස්වූයේ ද බෝධි සත්ව ගුණෝපේත පාලකයෙකුගේ ලක්ෂණයි. එබැවින් මෙරට පාලකයා බෞද්ධයෙක් විය යුතුය, යන සංකල්පය නිරන්තරව ජන සමාජය තුළ මුල්බැස ගත් අදහසක් විය.

16 වන සියවසේ කෝට්ටේ රජු වූ ධර්මපාල කිතු දහම වැළඳ රජු දොන් ජුවන් ධර්මපාල යන නමින් බෞතිස්ම ලබා කෝට්ටේ රාජ්‍ය සිය මරණින් පසු පෘතුගාල රජුට තෑගි ඔප්පුවකින් පවරා දෙන ලෙස කළ ප්‍රදානය නිසා මෙතෙක් රාජ්‍ය ආගම වූ බුදුදහමට ඉන් දැඩි බලපෑමක් එල්ල විය. 17 වන සියවස වනවිට මෙරට සිංහල රාජධානිය දිවයිනේ මධ්‍යයේ පිහිටි ඝන වනයෙන් පැවැති කන්ද උඩරට සීමා වුවත් බුදුදහම රාජ්‍ය ආගම ලෙස තවදුරටත් අනුග්‍රහය ලැබී ය.

නරේන්ද්‍රසිංහ රජුට මෙරට සිංහල රාජ්‍යයට උරුමකරුවෙකු නොමැති වූ බැවින් ඔහුගෙන් පසු සිංහල රාජ්‍යය ඔහුගේ බිසවගේ පරම්පරාවෙන් පැවතෙන දකුණු ඉන්දීය නායක්කර් වංශිකයන් අතට පත්විය. නමුදු ඔවුන් පවා බුදුදහම වැළඳ බුදුදහමට අනුග්‍රහ දක්වන්නන් වශයෙන් දළදා මාලිගාවෙ පැවැත්වෙන චාරිත්‍ර වාරිත්‍රවලට අනුග්‍රහ දැක්වීමේ පිළිවෙතක් ගෙන ගිය අතර සිංහල රාජ්‍යයේ අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වාම එය නොවෙනස්ව පැවැතුණි. බුදුදහම සිංහල රජවරුන්ගේ රාජ්‍ය ආගම වශයෙන් පැවැති තාත්කල්ම සෙසු ආගමිකයන් ද ආගමික සහනශීලිතාවයෙන් ජීවත් විය. එහෙත් කෝට්ටේ රජු කිතුදහම වැළඳ රාජ්‍යය පෘතුගාල රජුට පැවරෙන සේ දුන් ත්‍යාග ඔප්පුවත් සමඟ මෙරට ආගමික සහනශීලිතාවයට ද පහර වැදුනි. ඔවුන් විහාර සතු දේපළ ඉඩකඩම් කොල්ලකමින් ඒවා කතෝලික

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමේදී බුදුදහම තවදුරටත් ප්‍රමුඛස්ථානයේ පැවතිය යුත්තේ බුදුන්වහන්සේ සිය දහම තුළින් ආගමික සහනශීලිත්වය දක්වා ඇති බැවිනි. එහෙත් ආගමික සහනශීලිත්වය දේශනා නොකර ඇති ආගම්වලට රාජ්‍ය ආගම් ලෙස ප්‍රමුඛස්ථානයක් දුනහොත් හෝ බුදුදහමට රාජ්‍ය ආගම ලෙස පැවැති තත්ත්වය වෙනස් කළහොත් සිදුවනුයේ ව්‍යාප්තිවාදී ආගම් එකිනෙකා පරයා නැගී සිටීමේ මුහුණුවර වැඩී ගොස් ආගමික ඉගැන්වීම්වල පරස්පරතා ඇති වී අවිහිංසාවාදී ආගමක් වූ බුදුදහමේ ඉගැන්වීම් දැඩිව හිතට ගත් අයගේ අදහස් හා ගැටීමෙන් ආගමික ගැටුම්වලින් පිරි සමාජයක් බිහිවීමය.**

ක්‍රමවේදයක්ද ගෙනයෑම තුළින් මෙරට සමාජය ජාති, ආගම්. පන්ති වශයෙන් වඩාත් බෙදීමකට ලක්විය. අවසානයේදී බ්‍රිතාන්‍ය ආණ්ඩුව මෙරටට නිදහස ලබාදුන්නේ සිංහල රජු යටතේ පැවති, ආගමික

# බුද්ධාගමට ප්‍රමුඛස්ථානයක් පිරිනැමීමේ වැදගත්කම

ආගමික සහනශීලිතාවයෙන් පවතී විය. එහෙත් කෝට්ටේ රජු කිතුදහම වැළඳ රාජ්‍යය පෘතුගාල රජුට පැවරෙන සේ දුන් ත්‍යාග ඔප්පුවත් සමඟ මෙරට ආගමික සහනශීලිතාවයට ද පහර වැදුනි. ඔවුන් විහාර සතු දේපළ ඉඩකඩම් කොල්ලකමින් ඒවා කතෝලික පල්ලිය සතු දේපළ ඉඩකඩම් බවට පත්කර ගැනීමෙන් මෙරට එකම ජාතියක සිංහල ජනයා බෞද්ධ, කතෝලික වශයෙන් බෙදීමකට ලක්ව ඔවුනොවුන් කෙරේ වෛරයෙන් කටයුතු කරන තැනට පෙළැඹිණි.

බ්‍රිතාන්‍ය ආණ්ඩු සමයේ නැගී ආ පංච මහා වාදයන්ට මුල ධර්මපාල රජුගේ තෑගි ඔප්පුව තුළින් පැන නැගි ආගමික අසහනශීලිත්වය විය හැකිය. බහුතර ආගමික පිරිසක් කන්ද උඩරට වැනි සුළු ප්‍රදේශයකට සීමා වීමත්, කෝට්ටේ රාජ්‍ය තුළ බෞද්ධයන් සුළුතර ආගමික පිරිසගේ ආධිපත්‍යයට යටත් කිරීමත් ආගමික අසනශිලිතාව මෙරට බෞද්ධයන් තුළ ඇතිවීමට ප්‍රධාන හේතුවක් විය. බෞද්ධ වෙහෙර විහාර සතු ඉඩකඩම් පල්ලියට පවරාදීම තුළින් එම වෙහෙර විහාර නඩත්තුවට ආදායම් මාර්ග නොමැතිවීමෙන් විනාශ වන්නට විය.

පෘතුගීසින් සෘජුවම ඇතැම් වෙහෙර විහාර කඩා බිඳ දැමූහ. පෘතුගීසින් පැමිණෙන විට සිටි කෝට්ටේ රජු ඔවුන්ට බෞද්ධ රාජ්‍ය තුළ ආගම ප්‍රචාරය කිරීමට දීමට තරම් සහනශීලි විය. එසේම කන්ද උඩරට සිටි අවසාන සිංහල පාලකයා වූ නරේන්ද්‍රසිංහ රජු ද කිතු දහම කන්ද උඩරට ප්‍රදේශයේ ව්‍යාප්ත කිරීමේදී දැඩි නොවීය. එසේම ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ බෞද්ධ, හින්දු, මුස්ලිම්, හා කිතුනු බැතිමතුන් සිංහල රජුගේ ආධිපත්‍යය යටතේ ඉතා සාමකාමීව දිවි පෙවෙත ගතකරමින් රාජ පාක්ෂිකව සිට ඇත.

එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමේදී බුදුදහම තවදුරටත් ප්‍රමුඛස්ථානයේ පැවතිය යුත්තේ බුදුන්වහන්සේ සිය දහම තුළින් ආගමික සහනශීලිත්වය දක්වා ඇති බැවිනි. එහෙත් ආගමික සහනශීලිත්වය දේශනා නොකර ඇති ආගම්වලට රාජ්‍ය ආගම් ලෙස ප්‍රමුඛස්ථානයක් දුනහොත් හෝ බුදුදහමට රාජ්‍ය ආගම ලෙස පැවැති තත්ත්වය වෙනස් කළහොත් සිදුවනුයේ ව්‍යාප්තිවාදී ආගම් එකිනෙකා පරයා නැගී සිටීමේ මුහුණුවර වැඩී ගොස් ආගමික ඉගැන්වීම්වල පරස්පරතා ඇති වී අවිහිංසාවාදී ආගමක් වූ බුදුදහමේ ඉගැන්වීම් දැඩිව හිතට ගත් අයගේ අදහස් හා ගැටීමෙන් ආගමික ගැටුම්වලින් පිරි සමාජයක් බිහිවීමය.

දෙවැනි කරුණ නම් 1815 උඩරට ගිවිසුම ප්‍රකාරව මෙරට අවසාන සිංහල රාජ්‍යයේ රජුට හා ඔවුන්ගෙන් පැවත එන්නන්ට දෙමළ වර්ගයාට මෙරට රාජ්‍යයට ඇති උරුමය අහෝසි කර ඇත. ගිවිසුමේ 5 වැනි වගන්තියට අනුව 'මෙකී රටවල් වල මුලාදෑනි සහ වැසියන් විසිනුත් අදහන්නා වූ බුද්ධශාසනයද දේවාගම ද කඩකළ නොහැකිව පවත්වන්ඩ ඕනෑවා හා එහි කටයුතු ද සංඝයා ද විහාරස්ථාන ද දේවාලද පවත්වන්ඩ සහ ආරක්ෂා කරන්ඩ ඕනෑ යෑ' යන්න සඳහන් වීමෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව මෙරට සිංහල රාජ්‍යය දේශීය රදළ ප්‍රධානීන්ගෙන් භාරගෙන ඇත්තේ බුදුදහම ප්‍රමුඛ එහි කටයුතු විහාර හා සංඝයා වහන්සේලා ආරක්ෂා කරනවාය යන පොරොන්දු ප්‍රකාරවය. එබැවින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව උරුම කරදුන් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සුරකින රටක් වශයෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව සිංහල රදළවරුන්ට පොරොන්දු වූ 5 වැනි වගන්තිය සුරකීමේ පොරොන්දුව රැකීම පසුගිය රජයට සේම වර්තමාන රජයටද වලංගු වූ කරුණකි.

එසේම බ්‍රිතාන්‍යයන් උඩරට රාජ්‍යය යටත් කරන තුරු අප රට කිරීටයේ විජිතයක් වශයෙන් පිළිනොගැනුණි. බ්‍රිතාන්‍යයන්ට මෙරට කිරීටයේ විජිතයක් ලෙස අත්පත් කරගත හැකිවූයේ දේශීය රදළ ප්‍රධානීන්ගේ බලලෝභී, අවස්ථාවාදී ක්‍රියා කලාපයන් නිසා හා ඔවුන් විසින්ම සිංහල රාජ්‍යය අත්සන් කර බ්‍රිතාන්‍ය ආණ්ඩුවට දේශද්‍රෝහී ලෙස පාවා දුන් නිසාය. රාජ්‍යය ගිවිසුම් ප්‍රකාරව භාරදීමේ දී එහි අත්සන් කළ සියලු දෙනාම පැවති සිංහල රාජ්‍යයේ දේශීය සිංහල ප්‍රධානීන් හෝ ඔවුන්ගෙන් පැවැතෙන්නන් මිස දමිළ හෝ මුස්ලිම් ප්‍රධානීන් නොවීය. ඔවුන් මෙවැනි ගිවිසුමකට එළැඹුනේ ද ඔවුන් පනවනු ලැබූ ඇතැම් කොන්දෙසිවලට බ්‍රිතාන්‍ය රාජ්‍යය ද එකඟවීම නිසාය. බුදු දහම පවත්වාගෙනයාම පිළිබඳ 5 වන වගන්තිය ද එලෙස එකඟ වූ වගන්තියකි. එබැවින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමේදී බුදු දහමට ප්‍රමුඛස්ථානය පිරිනැමිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් රජය වගකිව යුත්තේ දෙමළ, මුස්ලිම් නායකයන්ට නොව සිංහල බෞද්ධ දේශීය ප්‍රධානීන්ගේ උරුමය අද දක්වා සුරකින සිංහල බෞද්ධ ජනතාවටය. බුදු දහමට පමුඛස්ථානය පිරිනැමිය යුතු බවට පළ කළ හැකි අනිත් තර්කය වනුයේ බටහිර ජාතින් මෙරට ආක්‍රමණය කර ආගමික සහනශීලිත්වය නැතිවන තැනට කටයුතු කරන තුරු මෙරට විවිධ ජාතින් හා ආගමිකයන් සිංහල රජු යටතේ බුදුදහමට ප්‍රබමුඛස්ථානයක් පිරිනමා තිබියදීත් ආගමික සහනශීලිත්වයෙන් කටයුතු කර ඇත. එසේම 1833 කොල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණවලින් මෙරට දේශීය රාජාණ්ඩුක්‍රමයේ පැවති අංග ලක්ෂණ වූ ඉඩම් භුක්ති ක්‍රමය, රාජකාරි ක්‍රමය අහෝසි වන ආකාරයට කටයුතු කිරීමෙන් දේශීය ආර්ථික රටාවද වෙනසකට ලක් වූ අතර, ඔවුන් ව්‍යාප්ත කළ වතු වගා ක්‍රමය තුළ මෙරට නිර්ධන හා ධනවත් පංති ක්‍රමයක් ද ඇතිවිය. වරින්වර ඇති කරන ලද ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණවලදී ජාතීන් බෙදා පාලනය කිරීමේ ක්‍රමවේදයක්ද ගෙනයෑම තුළින් මෙරට සමාජය ජාති, ආගම්. පන්ති වශයෙන් වඩාත් බෙදීමකට ලක්විය. අවසානයේදී බ්‍රිතාන්‍ය ආණ්ඩුව මෙරටට නිදහස ලබාදුන්නේ සිංහල රජු යටතේ පැවති, ආගමික සහනශීලිත්වයෙන් පැවති රාජ්‍යය වෙනුවට භේද බින්නවලින් පිරුණු රාජ්‍යයකටය. එසේම බලය පවරා දුන්නේ ද සිංහල ප්‍රධානීන්ට නොව භේද බින්න වූ ජාතින් පිරිසක් අතට ය. බ්‍රිතාන්‍යය ආණ්ඩුව විසින් සිදු කළ මෙම වරද ආගමික වශයෙන් රාජ්‍ය නොබෙදා නැවත සිදු නොකිරීමත් පෙර 1972, 1978 ව්‍යවස්ථාවලින් පිරිනමා තිබූ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනැමීම හා සම්බන්ධ වගන්තිය පවත්නා පරිදිම පවත්වාගෙන යෑම ප්‍රඥාගෝචර වේ. මක්නිසා ද යත් එය බහුතර බෞද්ධ සිංහල ජනතාව කෝප ගැන්වීමෙන් වළකාලීමට ඇති හොඳම විසඳුම වේ.

තව ද ප්‍රජාතාන්ත්‍රික රටක බහුතර ජනතාවගේ මතයට ප්‍රමුඛස්ථානය දියයුතු බැවින් ජනගහනයෙන් බහුතර ආගමික පිරිසක් වූ බෞද්ධාගමිකයන්ගේ අදහසට එකඟවීම බ්‍රිතාන්‍යයන් මෙරටට ලබාදුන් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමයටද අනුකූල වේ. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුක්‍රමය සුරකින රටක් වශයෙන් බහුතර ආගමික මතයට ඇහුම්කන්දීම ව්‍යවස්ථා විරෝධී නොවේ.

එබැවින් මෙකී කාරණා සියල්ල පිළිබඳ විමසා බලන කල්හි කිව හැකිවන්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමේදී ද බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනැමීමට කටයුතු කිරීම ප්‍රඥාගෝචර බවය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


මහාවංශය (සංස්.)- ගුණපාල විරසේකර, අනුල මුද්‍රණාලය, 1955.

උඩරට රාජධානිය (1470 - 1818), ටිකිරි අබේසිංහ, ලෝනා දේවරාජා

ජේ.පී.වී. සෝමරත්න, 1977.

ත්‍රී සිංහල (අවසන් අදියර)- පී.ඊ.පීරිස් (පරි.), සුචරිත ගම්ලත්, සේපාල විජේසේකර

උඩරට ගිවිසුම - රාජ්‍ය ලේඛනාගාරය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978, රජයේ මුද්‍රණාලය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - 1972, රජයේ මුද්‍රණාලය